මූලපණ්ණාසක (මුල් සූත්‍ර පණස)

47. වීමංසන සූත්‍රය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ අනේ පිඩු සිටුහු විසින් කරවනලද ජේතවන නම් විහාරයෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" යි භික්ෂූන්ට කථා කළහ. "ස්වාමීන්වහන්ස"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

"මහණෙනි, පරසිත් නොදන්නාවූ විමසන භික්ෂුව විසින් තථාගතයන් වහන්සේ සම්‍යක් සම්බුද්ධද? නැද්ද?යි දැනගනු සඳහා තථාගතයන් වහන්සේ පිළිබඳව විමසා බැලිය යුතුය."

"ස්වාමිනී, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ වෙතින් පහළ වන්නාහ, භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහ. ස්වාමීනි, මේ වචනයෙහි අර්ථයද භාග්‍යවතුන් වහන්සේටම වැටහේවා, භාග්‍යවතුන් වහනසේගෙන් අසා භික්ෂූහු දරන්නාහුය." "මහණෙනි, එසේවීනම් අසව්, මනාකොට මෙනෙහි කරව, කියන්නෙමි." "එසේය, ස්වාමීනි" යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

2. "මහණෙනි, පරසිත් නොදන්නාවූ, විමසන්නාවූ භික්ෂුව විසින් ධර්ම දෙකක් පිළිබඳව සර්වඥයන් වහන්සේ පරීක්ෂා කටයුතුයි. (එනම්) ඇසින් හා කණින් (දැකීමෙන් හා ඇසීමෙන්) දනයුතු ධර්මයන්හිය. ඇසින් හා කණින් දනයතුවූ ක්ලෙශ සහගත යම් ධර්ම වෙත්නම්, ඒ ධර්ම තථාගතයන් වහන්සේට ඇද්ද නැද්දැයි විසිය යුතුය. ඒ මේ කාරණය විමසන්නාවූ ශික්ෂුවමෙසේ දැන ගනියි. (එනම්) ඇසින් හා කණින් (දැකීමෙන් හා ඇසීමෙන්) දනයුතුවූ කෙලෙස් සහගත ධර්ම තථාගතයන් වහන්සේට නැත කියාය. යම් විටෙක එසේ විමසා බලන්නේ ඇසින් හා කණින් දනයුතු වූ, කෙලෙස් සහගත ධර්ම තථාගතයන් වහන්සේට නැතැයි දකිද, ඉක්බිති තවදුරටත් විමසා බලන්නේය. ඇසින් හා කණින් දනයුතුවූ මිශ්‍රවූ යම් ධර්ම (කලකදී හොඳ, කලකදී නරක ක්‍රියා හා වචන) වෙත්නම් ඒවා තථාගතයන් වහන්සේට ඇද්ද නැද්දැයි පරීක්ෂා කරන්නේය. ඒ කාරණය පරීක්ෂා කරන්නාවූ භික්ෂුව මෙසේ දැන ගනියි. (එනම්) මිශ්‍රවූ යම් ධර්ම වෙත්නම් ඒ ධර්ම තථාගතයන් වහන්නේට නැත කියාය. යම් විටෙක එසේ පරීක්ෂා

කරන්නේ හොඳ නරක මිශ්‍ර ධර්ම තථාගතයන් වහන්සේට නැතැයි දැන ගනීද, ඉක්බිති තවදුරටත් සෝදිසි කරන්නේය.

3. "ඇසින් හා කණින් දනයුතු වූ යම් පිරිසිදු (කෙලෙස් රහිත' ධර්ම කෙනෙක් වෙත්නම් ඒවා තථාගතයන් වහන්සේට ඇද්ද නැද්දැයි විමසා බලන්නේය. ඒ කාරණය පරීක්ෂා කරන භික්ෂුව මෙසේ දැන ගැනියි. (එනම්) පිරිසිදුවූ (කෙලෙස්' රහිත) යම් ධර්ම වෙත්නම් ඒ ධර්ම තථාගතයන් වහන්සේට ඇත කියාය. යම් විටෙක එසේ පරීක්ෂා කරන්නේ තපිරිසිදු වූ ධර්ම තථාගතයන් වහන්සේට ඇතැයි දැන ගනීද ඉක්බිති තවදුරටත් පරීක්ෂා කරන්නේය.

"මේ පින්වත් නෙමේ (බුදන් වහන්සේ) බොහෝ කලක් මුළුල්ලෙහි මේ කුසල ධර්මයෙන් යුක්ත වූයේද නැතහොත් සුලු කාලයක් තුළ එයින් යුක්ත වූයේදැයි පරිකෂා කරන්නේය. ඒ මේ කාරණය පරීක්ෂා කරන භික්ෂුව මෙසේ දැන ගනියි. (එනම්) මේ පින්වත් නෙමේ බොහෝ කලක් මුළුල්ලෙහි මේ කුසල ධර්මයෙන් යුක්ත වූයේය. සුලු කාලයක් තුළ නොවේ කියාය. යම් විටෙක එසේ පරීක්ෂා කරන්නේ මේ පින්වත් නෙමේ බොහෝ කාලයක් මුළුල්ලෙහි මේ කුසල ධර්මයෙන් යුක්ත වූයේය. සුලු කාලයක් තුළ නොවේ යැයි දැන ගනීද, ඉක්බිති තවදුරටත් පරීක්ෂා කරන්නේය.

4. "මේ පින්වත් භික්ෂුව ප්‍රසිද්ධ බවට පැමිණියේය. පිරිවර ආදී යසසට පැමිණියේය. ඔහුට මේ ලෝකයෙහි යම් යම් දොස් ඇත්දැයි පරීක්ෂා කරන්නේය. මහණෙනි, මේශාසනයෙහි (හින්ඔපුව) යම්නාක් ප්‍රසිද්ධ බවට නොපැමිණියේ වේද,පරිවාර සම්පත්තියටනොපැමිණියේද, ඒතාක් ඔහුට යම් යම් දෝෂයෝ ඇති නෙවෙත්. "මහණෙනි, යම් තැනක පටන් මහණතෙම ප්‍රසිද්ධයට පැමිණියේද, පිරිවරආදි සම්පත්තියට පැමිණියේද, එවිට ඔහුට මේ ලෝකයෙහි යම් යම් දෝෂයෝ ඇතිවෙත්. ඒ මේ කාරණය පරීක්ෂා කරන්නේ මෙසේ දනියි.මේ ආයුෂ්මත් භික්ෂු නෙමේ ප්‍රසිද්ධ බවට පැමිණියේය. පිරිවර ආදී සම්පත්තියට පැමිණියේය. ඔහුට මෙහි යම් යම් දෝෂ නැතැයි කියාය. යම්විටෙක එසේ පරීක්ෂා කරන්නේ මෙසේ දනීද, මේ ආයුෂ්මත් භික්ෂු නෙමේ ප්‍රසිද්ධ බවට පැමිණියහ. පිරිවර ආදී සම්පත්තියටපැමිණියේය. මේ ලෝකයෙහි ඔහුට යම් යම් දෝෂයෝ නැතැයි දැන ගනීද, ඉක්බිති තවදුරටත් පරීක්ෂා කරන්නේය.

"මේ ආයුෂ්මත් නෙම නීතිය වූයේද, මේ ආයුෂ්මත් නෙම භයින් යුක්ත වූයේ නොවේද, රාගය නැති කිරීමෙන් පහවූ රාග ඇති බැවින් කාමයන් සේවනය නොකරන්නේද? කියා පරීක්ෂා ක්‍රන්නේය. ඒ මේ කාරණය පරීක්ෂා කරන්නේ මෙසේ දනියි. මේ ආයුෂ්මත් නෙමෙ නිර්භය වූයේය. භයින් යුක්තවූයේ නොවෙයි, පහවූ රාග ඇති බැවින් කාමයන් සේවය නොකරයි. (කියා දැන ගනියි) මහණෙනි, අන්‍යයෝ ඒ භික්ෂුවගෙන් මෙසේ විචාරන්නාහුය. 'මේ පින්වත් නෙමේ නිර්භය වූයේ, භයින් යුක්ත වූයේ නොවෙයි, රාගය නැති කිරීමෙන් මහවූ රාග ඇති බැවින් කාමයන් සේවය නොකරයි කියා කියන්නට ආයුෂ්මතුන්හට ඇති කාරණයෝ කවරහුද? අනුමාන

කල්පනා කවරහුදැ'යි (අසන්නාහුය) මහණෙනි, මනාකොට ප්‍රකාශ නරන්නාවූ ඒ මහණ තෙම මෙසේ ප්‍රකාශ කරන්නේය. 'මේ ආයුෂ්මත් තෙමේ සමූහයා අතරෙහි වාසය කරන්නේ හෝ වේද, තනිව වාසය කරන්නේ හෝ වෙයිද, එහි මේ මනාව පිළිපදින පුද්ගලයෝ වෙත්ද, නොමනාව පිළිපදින පුද්ගලයෝ වෙත්ද, සමූහයා පිරිවරා සිටින පුද්ගලයෝ වෙත්ද, මේ ආයුෂ්මත් තෙමෙ, ඒ ඒ කාරණය නිසා ඒ ඒ පුද්ගලයාට අවමන් නොකරයි. 'මම නිර්භය වෙමි. මම භයින් යුක්තවූයේ නොවෙමි. රාගය නැති කිරීමෙන් පහවූ රාග ඇති බැවින් කාමයන් සේවනය නොකරමි'යි යන මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වෙතින්ම අසන ලදී. භාග්‍යවතුන් වහන්සේ හමුවෙන් පිළිගන්නා ලදී.

5. "මහණෙනි, එහිලා, ඇසින් හා කණින් දතයුතු යම් ලාමක ධර්මකෙනෙක් වෙත්ද,ඔහු තථාගතයන් වහන්සේට ඇද්ද නැද්දැයි තථාගතයන් වහන්සේගෙන්ම ඇසිය යුතුය. ප්‍රකාශ කරන්නාවූ තථාගත තෙම මෙසේ ප්‍රකාශ කරන්නේය.

"ඇසින් හා කණින් දතයුතුවූ යම් කෙලෙස් සහිත ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයෝ තථාගතයන් වහන්සේට නැත. ඇසින් හා කණින් දතයුතුවූ යම් මිශ්‍රවූ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයෝ තථාගතයන් වහන්සේට ඇද්ද නැද්දැයි (තථාගතයන් වහන්සේ ගෙන් ඇසිය යුතුය.) ප්‍රකාශ කරන්නාවූ තථාගත තෙම මෙසේ ප්‍රකාශ මෙසේ ප්‍රකාශ කරන්නේය. ඇසින් හා කණින් දතයුතුවූ යම් මිශ්‍රවූ ධර්මයෝ වේද, ඒ ධර්මයෝ තථාගතයන් වහන්සේට නැත.' (කියාය.) ඇසින් හා කණින් දතයුතුවූ යම් පිරිසිදුවූ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයෝ තථාගතයන් වහන්සේට ඇද්ද, නැද්දැයි (තථාගතයන් වහන්සේ ගෙන්මඇසිය යුතුයි) ප්‍රකාශ කරන්නාවූ, තථාගත තෙම මෙසේ ප්‍රකාශ කරන්නේය. 'ඇසින් හා කණින් දතයුතුවූ පිරිසිදුවූ යම් ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයෝ තථාගතයන් කෙරෙහි වෙති' (කියාය.) මම මේ ආජීවාෂ්ටමක ශීලය මාර්ගකොට ඇත්තේ වෙමි. මේ ආජීවාෂ්ටමක ශීලය ගොචර කොට ඇත්තේ වෙමි. ඒ පිරිසිදු ශීලයෙන් තෘෂ්ණා සහිත නොවෙමි. මහණෙනි, මෙසේ නියන්නාවූ ශාස්තෘන් වහන්සේ කරා ශ්‍රාවක තෙම, බණ ඇසීම පිණිස යන්නට සුදුසුය. ශාස්තෘන් වහන්සේ ඔහුට අතිශයින් ශ්‍රෙෂ්ඨවූ, අතිශයින් ප්‍රණීත වූ කුසලාකුසල ධර්ම විභාග සහිත වූ, ධර්මය දේශනා කරති. මහණෙනි, ශාස්තෘන්වහන්සේ භික්ෂුවහට අතිශියන් ශ්‍රෙෂ්ඨවූ, අතිශයින් ප්‍රණීතවූ කුසලාකුසල විපාක විභාග සහිත වූ, ධර්මය යම් යම් ආකාරයකින් දේසනා කෙරේද, ඒ ඒ ආකාරයෙන් හෙතෙම ඒ දේශනාකළ ධර්මය දැන ඒ ධර්මයන් අතුරෙන් එක් ධර්මයක් දැන, ධර්මයන්හි නිෂ්ඨාවට පැමිණෙයි. භාග්‍යවතුන් වහන්සේ සියල්ල මනාව තෙමේම අවබෝධ කළ උත්තමයායි කියාද, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාව ප්‍රකාශ කරනලදයයි කියාද, ආර්ය සංතෙම මනාව පිළිපන්නේයයි කියාද, ශාස්තෘන් වහන්සේ කෙරෙහි පහදයි.

6. 'මහණෙනි, අන්‍යයෝ ඒ භික්ෂුවගෙන් මෙසේ විචාරන්නාහුය. (එනම්) 'ආයුෂ්මත් තෙමේ, භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධය, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට

ප්‍රකාශ කරන ලද්දේය. සංතෙම මනාව පිළිපන්නේය යි මෙසේ කියන්නෙහිය. ආයුෂ්මන්හටඑසේ කිමට ඇති අනුමාන කල්පනා කවරහුද? මහණෙනි, මනා කොට, ප්‍රකාශ කරන්නාවූ, මහතෙම මෙසේ කියන්නේය.

ඇවැත්ති, මෙහි මම ධර්මශ්‍රවණය පිණිස භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද, එතැනට ගියෙමි. භාග්‍යවතුන් වහන්සේ ඒමට අතිශයින් ශ්‍රෙෂ්ඨවූ අතිශයින් ප්‍රණීත වූ කුසලාකුසල ධර්ම විභාග සහිත වූ, ධර්මය දෙශනා කරන සේක. ඇවැත්ති, යම් යම් ආකාරයකින් භාග්‍යවතුන් වහන්සේ අතිශ්‍රෙෂ්ෂ්ඨවූ, අතිශයින් ප්‍රණීත වූ, කුසාලකුසල ධර්ම විභාග විපාක දැක්වීම සහිතවූ, ධර්මය දේශනා කරන්ද, ඒ ඒ පරිද්දෙන් මම ඒ දේශනා කළ ධර්මය දැන, ඒ ධර්ම අතුරෙන් එක්තරා ධර්මයක් දැන ධර්මයන්හි නිමාවට පැමිණියෙමි. භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධය භාග්‍යවතුන් වහන්නේ විසින් ධර්මය මනාව ප්‍රකාශ කරනලදී. සංතෙම, මනාව පිළිපන්නේයයි ශාස්තෘන්වහන්සේ කෙරෙහි පැහැදුනෙමියි, (කියන්නේය.)

"මහණෙනි, යම් කිසිවෙකුට, ශාස්තෘන්වහන්සේ පරීක්ෂා කරන මේ ක්‍රමවලින්, මේ පදවලින්, මේ ව්‍යඤ්ජනවලින් තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව පිහිටියාද, (සෝවාන් මාර්ගයට පැමිණීම් වශයෙන්) හටගත් මුල් ඇත්තිද, මහණෙනි, යම් ශ්‍රද්ධාව වනාහි කරුණු සොයා පිළිගත් හෙයින් කරුණු සහිතයයිද සෝවාන් මාර්ගය මුල්කොට ඇත්තීයයිද, ස්ථිරයයිද, ශ්‍රමණයෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලෝකයෙහි කිසිවෙකු විසින් හෝ පැහැරගත නොහැකියයිද කියනු ලැබේ. මහණෙනි, මෙසේ වනාහි, තථාගතයන් වහන්සේ පිළිබඳ ඇති සැටියෙන් කරුණු සෙවීම වෙයි. මෙසේ වනාහි, තථාගතතෙම, ඇති සිටියෙන් මනාව පරීක්ෂා කරන ලද්දේවේ"යයි වදාළහ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

හත්වෙනිවූ විමංසක සූත්‍රය නිමි. (5 – 7)